**ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය සහ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1, 3.1.2 හා 3.1.3 වගුවල ඇතුළත් ආදායම් සංකේතවලට අදාළ ආදායම් ගිණුම් 02 ක්ද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

**1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ආදායම් ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම**

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන විෂය පථය**

---

ශීර්ෂය 253- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 සැප්තැම්බර් 04 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.13 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.9(අ) |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද, රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටුකරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.3 |
| | | 2. මහජනයා සඳහා සේවා ඉටු කිරීමේ අඩුපාඩු | 2.8 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වා ගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | 1. ආදායම් ගිණුම්වල අඩුපාඩු | 2.10(අ) (ආ) |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.11 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමණාකරණයේ අඩුපාඩු | 2.4 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | 1. අයවැය ඇස්තමේන්තු තාත්ත්වික ලෙස පිළියෙල නොකිරීම | 2.9(අ) |
| | | 2. වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල නොකිරීම/ ප්‍රමාද වී ඉදිරිපත් කිරීම | 2.2.2 |
| 128(1)(උ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | 1. ආදායම් ගිණුම්වල වූ අඩුපාඩු | 2.10(අ)(ආ) |
| | | 2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.11 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් / සේවකයන් මත අධිභාර පනවනු ලබන බව<br>(වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | 1. වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම<br>2. පාඩු හා හානි | 2.4.(අ)<br>2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

----------------------------------------

(i) රාජ්‍ය සේවක විශ්‍රාම ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව හා වැන්දඹු අනත්දරු පනතට අනුකූල වන පරිදි පිළිගැන්වීමේ ක්‍රියාවලිය නියාමනය කිරීම හා ඊට අදාල විධිවිධානයන් පැනවීම.

(ii) විශ්‍රාම වැටුප් සම්බන්ධව නෛතික රාමු, රීතීන්ට හා ප්‍රතිපත්ති තීරණවලට අනුකූලව රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප පිළිගැන්වීම.

(iii) මාසික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අඛණ්ඩව ගෙවීම හා එකවර ගෙවන ප්‍රතිලාභ නිරවද්‍යතාවයකින් යුක්තව පිළිගැන්වීම.

(iv) රාජ්‍ය සේවක අර්ථසාධක ක්‍රමය නියාමනය හා ප්‍රතිලාභ පිළිගැන්වීම.

(v) රජය වෙනුවෙන් වැන්දඹු අනත්දරු දායක මුදල් රැස් කිරීම හා අනෙකුත් ආදායම් රැස් කිරීම හා කළමනාකරණය කිරීම.

(vi) විශ්‍රාම වැටුප් සකස් කිරීමේ ඒකක හා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ වන බැංකු හා ගෙවීම් ජාලය සමඟ ඵලදායි සම්බන්ධතාවයක් පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය.

(vii) සමාජ ආරක්ෂණය පිළිබඳ ලෝක ප්‍රවණතා අධ්‍යනය කරමින් නූතන සමාජ ආරක්ෂණ ක්‍රමයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහාය වීම.

(viii) වාර්ෂික අයවැය පිළියෙල කිරීම හා ප්‍රගතිය පිළිබඳව ව්‍යවස්ථාදායකයට වගවීම.

(ix) සමස්ථ විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික හා සමාජ සුභසාධනයට අවශ්‍ය වැඩසටහන් හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීමට පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ දායකත්වය ලබා ගැනීම.

(x) විශ්‍රාමික සංගම් ප්‍රමුඛ කොටගත් සිවිල් සමාජය සක්‍රීයව සම්බන්ධ කර ගනිමින් ප්‍රාදේශිය සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගැනීම.

(xi) පරපුරවල් අතර අන්තර් සබඳතාව ගොඩනැංවීම සඳහා පුරෝගාමී ලෙස දායක වීම.

**2.2** **කාර්යසාධනය**

----------------

**2.2.1** **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැන්දඹු අනත්දරු අංශය තුල සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවීම් නොකල ගොනු 1500 කට අධික ප්‍රමාණයක් තිබූ අතර, ගෙවීම් ලබාගැනීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලද දින සිට නිලධාරියාගෙන් තොරතුරු නොලැබීම, ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලින් තොරතුරු ලබාදීම ප්‍රමාදවීම හා වෛද්‍ය මණ්ඩල වාර්තා නොලැබීම මත වර්ෂ 1 සිට 7 දක්වා කාලයක් ගෙවීමට නොහැකිව පැවති බව නියැදි පරික්ෂණයේදී නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවේ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල් අංශයට එවනු ලබන අයදුම්පත්‍රවල අඩුපාඩු දැක්වීමට මාස 3 සිට මාස 5 දක්වා කාලයක් ගත වී තිබුණි.

(ඇ) සමාජ සංරක්ෂණ දායක මුදල් ආපසු ගැනීම සඳහා ආයතන මඟින් එවනු ලබන විශ්‍රාමික නිලධාරියාගේ අයදුම්පත්‍ර තැපැල් අංශයට ලැබී දායක මුදල් අංශයට ලැබීමට දින එකක සිට දින 27 දක්වා කාලයක් සහ දායක මුදල් අංශයට ලැබී අඩුපාඩු දක්වා ලිපියක් යැවීමට දින 89 සිට දින 234 ක් දක්වා කාලයක් ගත වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානය වනවිට වැන්දඹු අනත්දරු දායක මුදල් ආපසු ගෙවීම් ශාඛාවේ අසම්පූර්ණ ගොනු 645 ක් තිබූ අතර ඉන් ගොනු 243 ක් එනම් සියයට 38 ක් වර්ෂ 3 කට පෙර දෙපාර්තමේන්තුවට ලද ගොනු බව නිරීක්ෂණය විය.

**2.2.2** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2017 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සභාගත කර නොතිබූ අතර කෙටුම්පත් වාර්තාව අනුමැතිය සඳහා 2018 අගෝස්තු 28 දින වනවිටත් සභාගත කර නොතිබුණි.

**2.3** **ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය නවීකරණය කිරීම සඳහා රු.මිලියනයක් වැය කර තිබූ අතර වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුලත් ක්‍රමවේදයට හා උපදේශකයන් තෝරා ගැනීම සහ සේවයේ නියුක්ත කරවීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 13.1 මාර්ගෝපදේශයට පටහැනිව තනි මූලාශ්‍ර තෝරාගැනීමේ ක්‍රමවේදය (Single Source Selection Method) යටතේ ප්‍රමාණවත් අත්දැකීම් රහිත නවක පුද්ගලික සමාගමක් තෝරා ගෙන තිබුණි. විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතියේ නඩත්තු සහ නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන නිර්දේශ හා නියමයන් (Terms of refferenace) හි අන්තර්ගත වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද යෝජිත කාර්යමණ්ඩලයේ ප්‍රධාන නිලධාරීන් සතුව නොතිබුණි.

(ආ) වටිනාකම රු.3,628,400 ක වූ කොන්ත්‍රාත් 4 ක් ආරම්භ කිරීම 2017 වර්ෂයේ පෙබරවාරි මස සැලසුම් කර තිබුණද, 2017 නොවැම්බර් හා දෙසැම්බර් මස ආරම්භ කර කඩිනමින් අවසන් කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 701(i) ප්‍රකාරව වටිනාකම රු. 3,628,400 ක් වූ කොන්ත්‍රාත්තු 4 ක ගිවිසුම්වල කොන්ත්‍රාත්තුව නිම කිරීමේ කාලය හා ප්‍රමාදය වෙනුවෙන් අයකරනු ලබන ප්‍රමාද ගාස්තු වැනි කරුණු ඇතුලත් කර නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1. මාර්ගෝපදේශය ප්‍රකාරව රු. 500,000 ක් ඉක්මවන විට කොන්ත්‍රාත්තුව සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කල යුතු වුවත් වටිනාකම රු. 1,752,575 ක් වූ ඡායා පිටපත් යන්ත්‍ර 6 ක්, වටිනාකම රු. 9,782,000 ක ලැප්ටොප් පරිගණක 100 ක් සහ වටිනාකම රු. 1,400,304 ක් වූ සර්වර් යන්ත්‍රය මිලට ගැනීමේදී මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.4 වත්කම් කළමනාකරණය

--------------------------

**(අ) වත්කම්වලින් රජයට ලැබිය යුතු ආදායම් නොලැබීම**

---------------------------------------------------

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රය ආයතන 17 කට බදු ලෙස ලබාදී තිබූ අතර, 2018 ජූනි 04 දිනට හිඟහිටි බදු කුලී ආදායම රු.මිලියන 50.79 ක් විය. ඉන් වසර 8 කට වඩා හිඟහිටි ශේෂය රු.මිලියන 27.72 ක් පැවති රාජ්‍ය ආයතන 4 ක් 2017 සැප්තැම්බර් 25 වන විට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර තිබුණු අතර ලිපිගොනු සහ ගිවිසුම් නොමැති නිසා හිඟ කුලී අයකර ගැනීමට නොහැකි තත්ත්වයේ පැවතුණි.

**(ආ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අවශ්‍යතාවය හඳුනා නොගෙන මිලදී ගෙන තිබූ වටිනාකම රු.940,780 ක ටෝන(ර්), රිබන් සහ පරිගණක ඩිස්කට් වැනි භාණ්ඩ අයිතම 12 කට අදාල ඡායා පිටපත් යන්ත්‍ර භාවිතය අඩුබව හා භාවිතා නොකිරීම නිසා 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා භාවිතයට ගෙන නොතිබුණි.

(ii) දෙපාර්තමේන්තු පරිශ්‍රයේ වර්ග අඩි 720 ක් වූ වෙරළ සංරක්ෂණ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ලබාදී තිබූ ගොඩනැගිලි පරිශ්‍රය ව්‍යාපෘතිය ඉවත් වූ 2014 ඔක්තෝබර් මස සිට නිෂ්කාර්යව පැවතුණි.

## 2.5 පාඩු හා හානි

-------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විසර්ජන ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයේදී විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් වටිනාකම රු.මිලියන 551.95 ක් වී තිබුණි. මෙම මුදල් වාරික වශයෙන් අයවෙමින් පැවතියද වර්ෂ 10 කට වැඩි කාලයක සිට පැවත එන රු. මිලියන 9.94 කින්ද, වර්ෂ 5 ක සිට වර්ෂ 10 ක් දක්වා පරාසයක කාලයක සිට පැවත එන රු. මිලියන 51.17 කින් හා වර්ෂ 5කට අඩු කාලයක සිට පැවත එන රු. මිලියන 490.83 කින්ද, සමන්විත විය.

(ආ) විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 සහ 104 පරිදි කටයුතු කර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. එසේම වැඩිපුර ගෙවා තිබුණු විශ්‍රාමිකයින්ගෙන් නැවත අයකර ගත් බව සනාථ කිරීමට හැකිවන පරිදි එක් එක් විශ්‍රාමිකයා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් ගොනු පවත්වා නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් ලෙස අවසාන ශේෂය රු. මිලියන 320.25 ක් දක්වා තිබුණද, 2017 වර්ෂයේ විසර්ජන ගිණුමේ ආරම්භක ශේෂය රු.මිලියන 321.36ක් ලෙස දක්වා තිබීම නිසා රු. මිලියන 1.11 ක වෙනසක් පැවතුණි.

(ඈ) හානි හා පාඩු උපලේඛනයේ 2016 වර්ෂයේ අවසන් ශේෂයන් හා 2017 වර්ෂයේ ආරම්භක ශේෂයන් සැසඳීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අයකිරීම්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 254 ක හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් කරන ඍජු අයකිරීම්වල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 45 ක වෙනස්කම් දක්නට ලැබුණි.

(ඉ) වර්ෂ 10/12 ට වඩා අඩු සේවා කාලයක් සහිත ආබාධිත ත්‍රිවිධ හමුදා සාමාජිකයින් වෙත සේවා විශ්‍රාම වැටුප සහ ආබාධිත විශ්‍රාම වැටුප ඒකාබද්ධ නොකොට වෙන වෙනම ගෙවීම හේතුවෙන් 2006 ජනවාරි 01 දිනට පසු විශ්‍රාම ගිය ත්‍රිවිධ හමුදා සාමාජිකයින් 717 දෙනෙකුට 2017 වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් මස දක්වා පමණක් රු. 18,868,554 ක් වැඩිපුර ගෙවා තිබූ බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 2.6 විසඳා නොතිබුණු විගණන ඡේද

--------------------------------

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|---|
| | වර්ෂය | ඡේද අංකය | |
| (i) | 2015 | 3.14(අ) | විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවන් 10 දෙනෙකු වෙත ගෙවන ලද රු.මිලියන 28.70 ක පාරිතෝෂික මුදලින් රු.මිලියන 15.94 ක මුදල අවුරුදු 10 ක් ඇතුළත අයකර ගෙන නොතිබුණි. |
| (ii) | 2013 | 2.7(අ) | ඉ-විශ්‍රාම වැටුප් ව්‍යාපෘතිය සඳහා වැටුප් හා වේතන, පුහුණු වීම් හැර රු. මිලියන 182.22 ක් වැය කර තිබුණද, 2013 නොවැම්බර් 01 දින සිට එම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නවතා දමා තිබුණි. |
| (iii) | 2013 | 1.6 (අ) I | පිරිවෙන් හා උපකෘත පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප වෙනුවෙන් මූලික වැටුපෙන් සියයට 6 ක් ලෙස ලැබෙන දායක මුදල් ගුරු විශ්‍රාම වැටුප් අරමුදලකට බැර නොකර රජයේ ආදායමට බැර කර තිබුණි. |
| (iv) | 2016 | 3.4 (ඊ) I | මධ්‍යගත දත්ත පද්ධතියේ ඇතුලත් විශ්‍රාමිකයන් විශ්‍රාමික සංගණනයක් තුළින් සනාථ කර ගෙන නොතිබුණි. |

## 2.7 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ කුලී පදනම මත පවත්වාගෙන යන තැපැල් කාර්යාලය ගිවිසුම්ගතවීමක් නොමැතිවීම හේතුවෙන් ස්ථාපිත දිනයක් හඳුනාගත නොහැකි වූ අතර 2017 ජුනි මස සිට 2018 පෙබරවාරි මස 28 දින දක්වා රු.මිලියන 1.62 ක හිඟ මුදලක් අයවිය යුතුව තිබුණි. තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2018 පෙබරවාරි 28 දිනෙන් පසුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් එම කාර්යාලය ඉවත් කර ගන්නා බව දන්වා තිබුණද ඉවත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් ඉහළ මාලයේ ඇති කාමර 3 ට ප්‍රවේශ වීමේ පහසුකම් ඇත්තේ තැපැල් කාර්යාලය තුලින් වන බැවින් කාමර තුනේම වර්ග අඩි 927 ක ප්‍රමාණය ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතුණි.

(ආ) විශ්‍රාම වැටුප් හිමි රාජ්‍ය සේවකයින්ගෙන් රාජ්‍ය සේවා විශ්‍රාම භාර අරමුදල සඳහා දායකත්වය ලබාගත් දින හා සාමාජික අංක නොමැතිව සමාලෝචිත වර්ෂයේදී විශ්‍රාමිකයින් 91,496 දෙනෙකුගෙන් වටිනාකම රු.මිලියන 7.26 ක් විශ්‍රාම වැටුපෙන් අය කරගෙන තිබුණි.

(ඇ) බාලවයස්කරුවන්ගේ රු.2,897,209 ක් වටිනා තැන්පතු සහතික 739 ක් හා රු. 192,629 ක් වූ ඉතිරිකිරීමේ ගිණුම් පොත් 02 ක් 2018 ඔක්තෝබර් 15 දින වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේ අනාරක්ෂිතව තබා තිබුණි.

## 2.8 මහජනයා වෙත සේවා ඉටු කිරිම.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව, ස්වකිය වෙබ් අඩවියේ මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා තැබිය යුතු තොරතුරු තබා නොතිබුණු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 පෙබරවාරි 03 දිනැති හා අංක 2004/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ නියෝග අංක 20 ප්‍රගාමී තොරතුරු ප්‍රකාශයට පත්කිරීම යටතේ, සෑම පොදු අධිකාරියක් විසින්ම විද්‍යුත් හෝ තාක්ෂණික ආකෘතියකින් ප්‍රකාශයට පත් කල යුතු වූ තොරතුරු ප්‍රකාශයට පත් කර නොතිබුණි.

## 2.9 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 145,137 | 139,768 | 5,368 | 4 |
| | මූලධන | 49 | 41 | 9 | 18 |
| | **එකතුව** | **145,186** | **139,809** | **5,377** | **3.7** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 147,128 | 145,718 | 1,410 | 0.95 |
| | මූලධන | 96 | 95 | 0.77 | 0.8 |
| | **එකතුව** | **147,224** | **145,813** | **1,411** | **0.96** |
| 2015 | පුනරාවර්තන | 187,567 | 180,235 | 7,333 | 3.9 |
| | මූලධන | 52 | 52 | 0.18 | 0.35 |
| | **එකතුව** | **187,619** | **180,287** | **7,333** | **3.9** |
| 2016 | පුනරාවර්තන | 200,623 | 199,105 | 1,518 | 0.76 |
| | මූලධන | 40 | 32 | 7 | 17.5 |
| | **එකතුව** | **200,663** | **199,137** | **1,525** | **0.76** |
| 2017 | පුනරාවර්තන | 210,876 | 210,065 | 811 | 0.38 |
| | මූලධන | 31 | 29 | 2 | 6.45 |
| | **එකතුව** | **210,907** | **210,094** | **813** | **0.39** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

---------------------------------------------------

වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 1.25 ක මුළු ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකර මුළුමනින්ම ඉතිරි වී තිබුණි.

**(ii) අධි ප්‍රතිපාදන සලසා තිබීම**

----------------------------

වැය විෂයයන් 09 ක් සඳහා එකතුව රු. මිලියන 1,008 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාළ ප්‍රතිපාදනවලින් එකතුව රු. මිලියන 672 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ක සිට සියයට 34 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**(ආ) වියදම් නියමිත පරිදි ගිණුම්ගත නොකිරීම.**

---------------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 45,792 ක් වූ ගෙවිය යුතු ණය ශේෂය විසර්ජන ගිණුමේ ඇමුණුමක් මඟින් අනාවරණය කර ඇති නමුත් භාණ්ඩාගාරය හා සම්බන්ධ වී, එම ණය ශේෂය ගිණුම්ගත කළ හැකි ආකාරයට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එහෙයින් උක්ත ණය ශේෂයට පාදක වී තිබූ විශ්‍රාම පාරිතෝෂික වියදම රජයේ වියදමක් ලෙස ගිණුම්ගත වී නොතිබුණි.

## 2.10 ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 22,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 22,940 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 104 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2017 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ අදායමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.04.01.00 | 14,000 | 15,531 | 1,531 | 111 |
| 20.04.02.00 | 8,000 | 7,409 | ( 591) | 92 |
| එකතුව | 22,000 | 22,940 | 940 | 104 |

ඉහත සඳහන් ආදායම් ගිණුම් සම්බන්ධයෙන් සිදු කළ විගණනයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) 20.04.01.00 දරන ආදායම් සංකේතය - සමාජ සංරක්ෂණ දායක මුදල්- මධ්‍යම රජය

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i). සමාලෝචිත වර්ෂය තුලදී රු.26,914,725 ක් ආදායමෙන් ආපසු ගෙවා තිබු අතර එම ගෙවීම්වලින් රු. 26,396,371 ක් තහවුරු කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව අදාල ආයතන වලින් හර නිවේදන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii). වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ආපසු ගෙවීම් යනාදී ප්‍රතිලාභ හිමිගැන්වීමේ දි දායක මුදල් ලැබීම් ඒ ඒ පුද්ගලයාගෙන් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න සනාථ කර ගැනීමට නිසි ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

### (ආ) 20.04.02.00 දරන ආදායම් සංකේතය - සමාජ සංරක්ෂණ දායක මුදල් - පළාත් සභා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). පළාත් සභාවල සේවයේ නියුතු ද්විතියික පදනම මත මුදාහරින ලද නිලධාරීන්ගේ දායක මුදල් ලැබීම් පිළිබඳ ලේඛන පවත්වා නොතිබුණු බැවින් ඊට අදාල හිඟහිටි දායක මුදල් පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii). ශීර්ෂ අනුව ආදායම් සංකේතයට බැර කර තිබුණු දායක මුදල් හා හිඟ මුදල් තහවුරු කර ගැනීමට හැකිවන පරිදි සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රැස් කරන ලද රු.මිලියන 7,409.26 ක් වූ ආදායම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකිවී තිබුණි.

(iii). ආදායම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 496.30 ක හිඟ ආදායමක් පැවතුණි. පළාත් සභාවලින් වාර්තා කර තිබුණු වටිනාකම් පමණක් හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණද බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන ආයතනයන්ගේ හිඟ ආදායම් ගිණුම් ගත කර නොතිබුණි.

(iv). පළාත් සභා 02 කින් ලබාගත් තොරතුරු අනුව 2017 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැන්දඹු හා අනත්දරු දායකය ලෙස වාර්තා කර තිබූ අගය හා ආදායම් ගිණුමේ එම පළාත් සභා යටතේ වර්තා කර තිබූ හිඟය අතර රු.මිලියන 23.28 ක විචලනයක් පැවතුණි.

## 2.11 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 25301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 53.00 | 53.00 | 28.00 | 29.44 | 160.00 | 138.70 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට වැඩ තහනම් කර ඇති, සේවය අතහැර ගොස් ඇති, රජයේ අමාත්‍යාංශවලට/ දෙපාර්තමේන්තුවලට මාරු වී ගිය හා පළාත් සභා ආයතන සඳහා මාරු වී ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතුව තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 1.82 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂයන් වර්ෂ 01 ක සිට 04 ක දක්වා හා වර්ෂ 05 ට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විවිධ පියවර ගෙන තිබුණද මෙතෙක් නිරවුල් කර නොතිබුණි.

**2.11.1 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

**ගැලපුම් කළයුතු ශේෂ**

----------------------

සමාලෝචිත වර්ෂය අවසානය වනවිට මහජන බැංකුවේ අංක 033-1001-6-9026657 දරන ජංගම ගිණුමේ 2015 ජනවාරි සිට 2016 ඔක්තෝබර් මස දක්වා පැවත එන වටිනාකම රු. 173,255 ක්වූ හඳුනා නොගත් ගෙවීම් අවස්ථා 7 ක් 2018 ජූලි 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**2.13 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

---------------------------------------------------------------------------------------

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 456. 48 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 23 | 12 | - |
| (ii) | තෘතියික මට්ටම | 11 | 06 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1078 | 896 | 182 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 64 | 11 | - |
| (v) | වෙනත් (අනියම්) | - | 4 | - | 4 |
| | එකතුව | 1199 | 993 | 210 | 4 |

**කාර්ය මණ්ඩලය පුහුණු කිරීම**

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා පුහුණු කිරීම් වෙනුවෙන් රු.මිලියන 1.09 ක් වැය කර තිබුනත් 993 ක් වූ මුළු කාර්යය මණ්ඩලයෙන් 928 දෙනෙකුට අවම වශයෙන් පැය 8 ක වත් පුහුණුවක් ලබා දී නොතිබුණි.